# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුමිය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 12
NUMBER 02

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MAY/JUNE 10, 2009 මැයි/ජුනි මාස (බුද්ධ වර්ෂ 2553 වෙසක්/පොසොන් මාස)


# විස්මයජනක විජයග්‍රහණය



Photograph - Sri Lanka Defence Ministry Media Unit

♦ සංජය විමලරත්න විසිනි

**2009** මැයි **19** වෙනිදා අප ශ්‍රී ලාංකීය වීරෝදාර හමුදා දශක තුනකට අධික කාලයක් තිස්සේ අප රට සහ ජනතාව නිර්දය ලෙස පෙලූ රුදුරු කොටි සතුරන් යුදමය ලෙස මුළුමනින්ම පරදවා අති විශිෂ්ට ජයග්‍රහණයක් අත්පත් කරගත් බව මුළුමහත් ලෝකයා දැන් දැන සිටිති. අප මෙන්ම අප රටේ බහුතරයක් ජනතාව සිත්සතන් උතුරා යන ප්‍රීතියෙන් මෙම විජයග්‍රහණය භුක්ති විඳින බවද අපි හොඳාකාරවම දනිමු.

ජයග්‍රහණයේ ශුභ පණිවිඩයක් ලංකා විත්ති පුවත්පතේ පළකරන්නට කවදා හැකි වේදෝයි අප බොහෝ කලක සිට බලා සිටියාසේ ම අප පාඨක සමූහයා ද ඒ පුවත ඇසීමට පුල පුලා බලා සිටි බව ද නොඅනුමාන ය.

මෙය අද අප පමණක් නොව සමස්ථ ලෝකයාම අත්දුටු ඉමහත් පුදුමාකාර සිදුවීමක් බව නොකියා බැරිය. කිසිදාක සිදුවේයයි නොසිතූ, කිසිදා පරාජයකළ නොහැකියයි බොහෝ දෙනා විශ්වාසකළ, කොටින් අනභිබවනීය යයි දෙමළ ජනයා කටමැත දෙඩූ, එසේම ශ්‍රීලංකාවට කිසිසේත් ජයගත නොහැකි යුද්ධයක්යයි කී, නුදුරු අනාගතයේ ඊළාම් රාජ්‍ය යක් බිහිවන බවට බොහෝ අය අනාවැකි පළ කළ යුදමය තත්වයක් මුළුමනින්ම උඩුයටිකුරු කරමින් ශ්‍රී ලංකාව අත්පත් කරගත් මෙම යෝධ ජයග්‍රහණය ඉතිහාසයේ සටහන්වනු ඇත්තේ සැබැවින්ම ප්‍රාතිහාර්‍යයක් ලෙසටය.

4 වෙනි පිටුව බලන්න ➞

ලක් බිම පෙලූ රුදු යුද බිය නිමා කර
ලක් වැසි මුවග හස රැල්ලක් උදා කර
ලක් ගුවනතෙහි තුම් සිහ ධජ විදා හැර
ලක් මව කඳුළු පිසලූ නුඹ සදා දර

Ending of the vicious war that destroyed our land
Brings rejoice of relief to all the nation as one
There flutter the proud lion flags above in the sun
No more tears for Mother Lanka,
you wiped it my dear son

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website
http://www. lankaheritage.com/lankaviththi/




ඔබේ මුදල් අදම යවන්න
අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3